# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - තෙවන වසර -2016/2017

# පොදු අන්තර්ජාතික නීතිය

(පැය තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න

(නොපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරෙයි)

---

1. "සෑම අන්තර්ජාතික අසාධාරණයක්ම, සම්මුතියක ඇති නීතිමය වශයෙන් බැඳීමට ලක්වන අන්තර්ගතයක කොටසක් බවට පත් කිරීම තුළින් පමණක් අන්තර්ජාතික නීතිය බවට ඔසවා තැබිය හැකිනම් අන්තර්ජාතික නීතිය සදාචාරමය නියෝගයක් (moral order) බවට වන අදහස හුදු මිත්‍යාවක් බවට අඩු කළ හැකිය."

   පොදු අන්තර්ජාතික නීතියේ ස්වභාවය සහ එහි ඓතිහාසික වර්ධනය ඇසුරින්, මෙම නීතිය පරිණාමය වීමේදී එය මුහුණ දුන් අභියෝග කෙරෙහි විශේෂ අවධානයක්ද සහිතව, ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

2. "1945 වර්ෂයේ සිට රාජ්‍යයන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු අන්දමින් වැඩිවූ අතර අනෙකුත් අන්තර්ජාතික පාත්‍ර වර්ගයා මතුවීම ද ඇරඹුණි. යම් අස්තිත්වයක් (entity) අන්තර්ජාතික නීතියෙන් පාලනය වන්නේද යන්න සහ එය අන්තර්ජාතික ප්‍රජාවේ සාමාජිකයෙකු බවට පත් වන්නේද යන්න තීරණය කරනු ලබන සිද්ධාන්ත සහ භාවිතයන්ද කාලයාගේ ඇවෑමෙන් වෙනස් වී තිබේ."

   ඉහත දැක්වූ ප්‍රකාශය විවේචනාත්මකව විමර්ශනය කරන්න. ඔබේ පිළිතුරු උචිත නිදර්ශන ඇසුරෙන් තහවුරු කළ යුතුය.

3 "අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය අතර සම්බන්ධතාවය හා අදාළ නීතිමය න්‍යායයන් පැවතියද රාජ්‍යයන් තුළ සැබවින්ම සිදු වන්නේ එක් විශේෂිත න්‍යායයකට පක්ෂපාතීව එය අනුගමනය කරනවාට වඩා ප්‍රායෝගිකත්වය සහ දේශපාලන කැමැත්ත මත පදනම්ව කටයුතු කිරීම යි ."

   තෝරා ගත් අධිකරණ බල ප්‍රදේශයන් තුළ මතු වෙමින් පවතින ප්‍රවණතා පිළිබඳ නිදර්ශන ඉදිරිපත් කරමින් සහ අදාළ නීතිමය අධිකාරයන් උපුටා දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

4. අ සහ ආ යන කොටස් **දෙකටම** පිළිතුරු සපයන්න

අ. දීනාලන්තයේ ජීවත් වන කෙන් බෙරිකා රාජ්‍යයේ පුරවැසියෙකි. බෙරිකානු ජනාධිපතිවරයාව විවේචනය කරමින් පොතක් ලිවීම හේතුවෙන් ඔහුට මරණ තර්ජන එල්ල වූ බැවින් කෙන් රටින් බැහැර වී තිබේ. එක් දිනක් දීනාලන්තයේ වීදි ඔස්සේ ගමන් කරමින් සිටියදී රොබින් නමැත්තා කෙන්ට පහර දී ඔහුව මරා දැමිය. අනතුරුව රොබින්ව අත් අඩංගුවට ගත් දීනාලන්ත පොලීසිය ඔහු ලොවේනියා රාජ්‍යයේ පුරවැසියෙකු බව දැනගනී. දීනාලන්තයේ සිටින බෙරිකානු රාජ්‍යයේ නියෝජ්‍ය තානාපතිවරිය වන ජෙනී කෙන්ව මරා දැමීම සඳහා තමන්ව කුලියට ගත් බව රොබින් කියා සිටී. දීනාලන්තයේ පොලීසිය ජෙනීව අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කරනු ලැබූ අතර තමන්ව පොලීසිය විසින් අවමන් සහගත සැලකීමකට ලක් කරනු ලැබූ බවට ජෙනී පැමිණිලි කරයි.

ආ. බෙරිකානු ජනාධිපතිවරයා වැදගත් කලාපීය සම්මන්ත්‍රණයකට සහභාගී වීම සඳහා මිඩ්ල්ස්ටන් රාජ්‍යයට ගමන් කරයි. බෙරිකා ජනාධිපතිවරයාට එරෙහි පෝස්ටර් ඔසවා ගත් විරෝධතාකරුවෝ ඔහු නවාතැන් ගෙන සිටින හෝටලය අසල රැස් වී "මිනීමරුවා" යැයි ඝෝෂා කරති. එක්තරා දිනයකදී බෙරිකානු ජනාධිපතිවරයා තම ආරක්ෂක ගටයන් විරෝධතා කරුවන්ට පහරදී බරපතල තුවාල සිදු කරන අතරතුර ඔවුන් අසල සිටගෙන සිටින බව වීඩියෝ පටයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබයි. එසේම, දීනාලන්ත රාජ්‍යය කෙන්ගේ මරණය සිදු කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් බෙරිකානු ජනාධිපතිවරයාව අත් අඩංගුවට ගැනීම සඳහා අන්තරජාතික වරෙන්තුවක් නිකුත් කරයි. මෙම සියලු කරුණු තිබියදීත් තම රට තුළ සම්මන්ත්‍රණයකට සහභාගී වෙමින් සිටින අතරතුරේදී බෙරිකානු ජනාධිපතිවරයාව අත් අඩංගුවට ගැනීම මිඩ්ල්ස්ටන් ආණ්ඩුව ප්‍රතික්ෂේප කරයි.

අන්තර්ජාතික නීතියේ අදාළ සිද්ධාන්ත ඇසුරින් බෙරිකා, ලොවේනියා මිඩ්ල්ස්ටන් සහ දීනාලන්ත රාජ්‍යයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

5. යෝගා රාජ්‍යයේ ජීවත් වන වාර්ගික කණ්ඩායම් අතරින් බහුතර ජන වර්ගය සිරෝම්වරුන් වන අතර සුළුතර වාර්ගික කණ්ඩායම් වන්නේ විරෝකන්වරු සහ නයිලිකන්වරුය. යෝගාවේ දකුණු ප්‍රදේශයේ බහුල ලෙස ජීවත්වෙන විරෝකානුවෝ වෙනම රාජ්‍යයක් ඇති කිරීමට බලාපොරොත්තු වෙමින් සියලු අසල්වාසී රාජ්‍යයන්ගෙන් ඒ සඳහා උපකාර ඉල්ලා සිටිති. අසල්වාසී රාජ්‍යයක් වන අමානියාව විරෝකානුවන්ට උදවු කිරීමට කැමැත්ත පළකරයි. 2016 වසරේදී යෝගාවේ දකුණු ප්‍රදේශයේ පාලනය අල්ලා ගන්නා විරෝකානුවෝ එහි නව ආණ්ඩුවක් පිහිටුවති. මෙම දේශගුණය නව විරෝකානු රාජ්‍යයක් ලෙස පිළිගන්නා අමානියාව එය සමග ද්විපාර්ශවික සම්බන්ධතා අරඹමින් එහි නව අමානියානු තානාපති කාර්යාලයක් පිහිටුවීමට අදහස් කරයි. අමානියානුවන් විසින් විරෝකානුවන් සමග පවත්වාගෙන යන නිරන්තර සහයෝගීතාවය සහ සම්බන්ධතාවය යෝගාව දැඩි ලෙස නරහ ගැන්වීමට හේතු වෙයි. කලාපයේ වෙන කිසිදු රාජ්‍යයක් විරෝකානුවන් සමග සම්බන්ධතා පැවැත්වීමට හෝ ඔවුන්ට සහයෝගය දැක්වීමට ඉදිරිපත් නොවෙති.

යෝගාව තුළ තිබෙන අම්‍රානියාව සතු සියලුම වත්කම් තහනම් කිරීමටත්, යෝගා දේශභූමිය තුළ සිටින සියළුම අම්‍රානියානුවන් පලවා හැරීමටත්, එම දෙරට අතර අත්සන් තබා තිබෙන සියලුම ද්විපාර්ශවීක සම්මුතීන්ට ගරු නොකිරීමටත් යෝගාව තීරණය කරයි.

යෝගාව සහ අම්‍රානියාව අතර හටගෙන තිබෙන අර්බුදය විසඳීම සඳහා යොදා ගත හැකි විවිධ ක්‍රම භේද සහ ආකාර පිළිබඳව උපදෙස් පත්‍රිකාවක් (opinion paper) ලියා දක්වන්න.

6. අ සහ ආ යන කොටස් දෙකෙන් එකකට පමණක් පිළිතුරු සපයන්න

අ. ඛනිජ ද්‍රව්‍ය වලින් පොහොසත් උතුරුලන්තය දූෂණ වලින් පිරුණු රාජ්‍යයකි. මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් උතුරුලන්තයේ උප ජනාධිපතිවරයා වන ගෝයෝ මහතාට එරෙහිව වොකෝලන්ත රාජ්‍යයේ ආණ්ඩුව විමර්ශන පවත්වමින් සිටියි. විමර්ශනයන්හි එක් පියවරක් ලෙස වොකෝලන්තය තුළ තිබෙන ගෝයෝ මහතාගේ බැංකු ගිණුම් සහ ඔහු විසින් සිය චාරිකා සඳහා යොදා ගන්නා 'උතුරු තරුව' නමැති සුඛෝපභෝගී කුඩා යාත්‍රාව තහනම් කරමින් වොකෝලන්තය කියා සිටින්නේ ගෝයෝ මහතා එම යාත්‍රාව මිලදීගෙන තිබෙන්නේ උතුරුලන්තයෙන් සොරා ගත් මහජන මුදල් උපයෝගී කරගෙන බවයි. වටිනා ඛනිජ ද්‍රව්‍ය අනෙකුත් රටවලට ප්‍රවාහනය කිරීම සඳහා උතුරුලන්තය භාවිතා කරනු ලබන 'උත්තරධ්‍රැවය' නමැති නෞකාවද වොකෝලන්තය තහනම් කරයි. වොකෝලන්තය විසින් තම දේපල තහනම් කිරීම සම්බන්ධයෙන් බලවත් ලෙස නොසන්සුන් වන උතුරුලන්තය එම ක්‍රියාවන් අන්තර්ජාතික නීතිය උල්ලංඝනය කිරීමක් ලෙස හඳුන්වයි.

අදාළ අන්තර්ජාතික සිද්ධාන්ත සම්බන්ධයෙන්, ඒවායේ ඓතිහාසික වර්ධනය කෙරෙහිද විශේෂිත අවධානය යොමු කරමින් සහ අදාළ නෛතික අධිකාරීන් උපුටා දක්වමින්, වොකෝලන්තයට උපදෙස් දෙන්න.

ආ. කොරිනා රාජ්‍යයේ පුරවැසියෙකු වන ඔස්මන් මහතාව වොන්ඩර්ස්ථානයේ සංචාරය කරමින් සිටින අතරතුර එරට බලධාරීහු අත්අඩංගුවට ගත්හ. 2006 -2016 අතර කාලය අතරතුරදී ඔස්මන් මහතා කොරිනා ආණ්ඩුවේ ස්වදේශ කටයුතු ඇමතිවරයා ලෙස කටයුතු කළේය. 'කොරිනාවේ මව්වරු' නමැති සංවිධානය විසින් ගොනු කළ පැමිණිල්ලක් මෙලෙස ඔහුව අත් අඩංගුවට ගැනීමට පදනම් වී තිබේ. කොරිනාවේ දේශපාලන විරුද්ධවාදීන්ව බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම සම්බන්ධයෙන් ඔස්මන් මහතා වගකිව යුතු බවත්, දේශපාලන විරුද්ධවාදීන්ගේ පවුල්වල අය බලහත්කාරයෙන් රැඳවූම් කඳවුරු වල ගාල් කොට බර වැඩ කිරීම සඳහා ඔවුන්ට බලපෑම් කරන ලද බවත් එම පැමිණිල්ල දක්වයි අන්තර්ජාතික නීතිය යටතේ තමන්ව අත් අඩංගුවට ගැනීමට සහ නඩු පැවරීමට වොන්ඩර්ස්ථානයට කිසිදු බල අධිකාරියක් නොමැති බව ඔස්මන් මහතාගේ විශ්වාසයයි.

ඉහත සිදුවීමට අදාළ අන්තර්ජාතික නීති සිද්ධාන්ත සාකච්ඡා කරන්න. මෑතකාලීන නඩු තීන්දු සහ අදාළ නිදසුන් ඔබේ පිළිතුරට ඇතුළත් විය යුතුය.

7. "රාජ්‍යයක දේශගුණිය තුළ සිටින විදේශිකයන් ආරක්ෂා කිරීමේ ක්‍රමයක් ලෙස රාජ්‍ය වගකීම පිළිබඳ සිද්ධාන්තය ආරම්භ විය. එහෙත් එය වර්තමාන සංදර්භය තුළ වැදගත්කමක් දරන්නේ පෞද්ගලික පාත්‍ර වර්ගයා විසින් සිදු කරන වැරදිසහගත ක්‍රියා හෝ නොකර හැරීම් සම්බන්ධයෙන් රාජ්‍යයට වගකීම පවරමින් අන්තර්ජාතික නීතියේ රාමුව යටතට පත්ව වූ පෞද්ගලික පාත්‍ර වර්ගයා ගෙන එනු පිණිස වන ප්‍රයෝජනවත් ක්‍රම වේදයක් වන හෙයිනි."

රාජ්‍ය වගකීම පිළිබඳ සංකල්පයේ ඓතිහාසික වර්ධනය සහ මෙම සංකල්පය නූතන අභියෝග වලට මුහුණ දීම සඳහා යොදා ගන්නේ කෙසේද යන්න කෙරෙහි අවධානය දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

======